# හතරවන තේමාව - යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවිසමිඳාණන් සමඟ ගැඹුරු සම්බන්ධතාවය

24

## 4.2. පෞද්ගලික හා පොදු යාච්ඤා දෙවිඳුන් වෙත යොමු කරමු.

කිතුනු ජීවිතය රඳා පවතිනුයේ යාච්ඤාව මත බව ඔබ දැනටමත් දන්නවා ඇතැයි සිතමු. පසුගිය පාඩමේ දී යාච්ඤාව යනු කුමක් ද? යාච්ඤා කිරීමට ඇති බාධක හා අප යාච්ඤා කළ යුතු ආකාරය ගැනත් අපි කථා කළෙමු. එසේනම් දැන් අපි පෞද්ගලික හා පොදු යාච්ඤා ගැන සලකා බලමු. තනි තනි ව යාච්ඤා කිරීම පෞද්ගලික යාච්ඤා ලෙසත්, කණ්ඩායම් වශයෙන් සාමූහික ව කරන යාච්ඤා පොදු යාච්ඤා ලෙසත් සැලකේ.





යාච්ඤා කිරීමට නො දන්නා පුද්ගලයා ජීවත්වීමටනොදනී.

(ශා. ජෝන් ක්‍රිසොස්තොම්)



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මෙයින් යාච්ඤාවේ ඇති වැදගත්කම මොනවට පැහැදිලි වේ.

## පෞද්ගලික යාච්ඤාව

මෙය අපගේ ජීවිතයට ඉතාමත් අවශ්‍ය දෙයකි. දිනපතා පෞද්ගලික යාච්ඤාවේ යෙදෙන තැනැත්තාට එදිනෙදා ජීවිතයේ ප්‍රශ්න හා අභියෝගවලට මුහුණ දීමට ශක්තිය ලැබේ. එසේ ම දෙවියන් වහන්සේ අප අතර හා අප තුළ වැඩ වසන බව පෞද්ගලික යාච්ඤා මගින් ගැඹුරින් වටහා ගැනීමට හැකිවේ. අපගේ හෘද අභ්‍යන්තරයට අවතීර්ණ වීමටත් අපට ලැබෙන සතුට මෙන්ම වේදනාත්මක අත්දැකීම් එක ලෙසින් භාර ගැනීමටත් පෞද්ගලික යාච්ඤාව මගින් විශේෂ අනුබලයක් ලැබේ.

ඉහතින් දැක්වූයේ පෞද්ගලික යාච්ඤාවෙන් අපගේ ජීවිතයට ලැබෙන ආලෝකයන් ය.

**'තම ජීවිතය එකම යාච්ඤාවක්' බව යම් කෙනෙකුට කිව හැකි ව තිබුණා නම් එසේ කීමට හැකිවනුයේ ක්‍රිස්තුන් වහන්සේට පමණකි.**

එයට හේතුව නම් ඔවුන්වහන්සේ සැම විට ම පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරමින් පියාණන් වහන්සේට බැඳී සිටි නිසා ය.

මාගේ භෝජනය නම්, මා එවූ තැනැත් වහන්සේ ගේ කැමැත්ත කිරීමත්, උන්වහන්සේගේ කාර්යය නිමාවට පත් කිරීමත් ය.

(ජොහාන් 4:34)

හිරු උදාවීමට බොහෝ කලින් ඔවුන්වහන්සේ අවදි ව හුදකලා තැනකට ගොස් යාච්ඤා කළ සේක.
(මාර්ක් 1:35)

ඔවුන්වහන්සේ ජනකාය යැවූ පසු, යාච්ඤා කරන පිණිස වෙන් ව කන්දකට වැඩිය සේක. (මතෙව් 14:23)

තවද, ඒ දවස්වල දී ඔවුන්වහන්සේ යාච්ඤා කරනු පිණිස කන්දකට නැගී දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් මුළු රැය ගෙවූ සේක.
(ලූක් 6:12)

මේ සියල්ලෙන් පෙනී යන්නේ පෞද්ගලික යාච්ඤාවේ ඇති වැදගත්කම හා අවශ්‍යතාවය යි.

එදිනෙදා ජීවිතයේ වැඩ කටයුතු ආරම්භ කිරීමට පෙර කෙටි යාච්ඤාවකින් එය ආරම්භ කළ යුතු බව ඔබ දන්නෙහි ද? එයින් කෙරෙන්නේ ඔබගේ දවසේ වැඩ කටයුතු වලට දෙවියන් වහන්සේගෙන් ආශිර්වාද ඉල්ලා ගැනීමකි. දේව කැමැත්ත අනුව අපගේ කාර්යයන් පහසුවෙන් කර ගැනීමට ශක්තිය හා ධෛර්යය ලබා ගැනීමකි.

- ඔබගේ දවසේ වැඩ කටයුතු ආරම්භ කිරීමට පෙර දෙවියන්ගෙන් වරප්‍රසාද ඉල්ලා උච්චාරණය කිරීමට සුදුසු කුඩා යාච්ඤාවක් ලියන්න.

## සාමූහික යාච්ඤාව

බයිබලය ආරම්භයේ සිට අවසානය දක්වා ම සාමූහික යාච්ඤාව පිළිබඳ කරුණු අපට පහදා දෙයි. ඔබ ද ඔබගේ පවුලේ සැම දෙන ද එක් රැස්වී දිනපතා කරන යැදුම මේ ගණයට වැටේ. සමූහයක් ලෙස යාච්ඤා කරන විට සුදුසු පරිසරයක් සකස් කර තිබේ නම් එකෙකාගේ විශ්වාසය එයින් වඩාත් ශක්තිමත් වේ.

**නිතර භාවිතා වන පොදු යාච්ඤා:**

- ❒ සාන්ත කුරුසිය
- ❒ ත්‍රිත්ව ස්තෝත්‍රය
- ❒ ස්වාමිවාක් ආරාධනාව
- ❒ දේව දූත මංගලම්
- ❒ විශ්වාස ලක්ෂණය
- ❒ උදය ආරාධනාව
- ❒ දයාධික මනස්තාපය
- ❒ ස්ප්‍රිතු සාන්තු යාච්ඤාව
- ❒ භෝජන ආශිර්වාදය
- ❒ භෝජන ස්තෝත්‍රය
- ❒ රැකවල් දූතයාට යාච්ඤාව
- ❒ රාත්‍රී ආරාධනාව

- ඔබ දන්නා පොදු යාච්ඤා කීපයක් ලියන්න.

- ..............................................................................................................


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

- ..........................................................................................................................................

- ..........................................................................................................................................

- ..........................................................................................................................................

ඔබ කොතරම් දුරට සමූහික යාච්ඤා වලට සහභාගි වන්නේ දැ යි සිතා බලන්න.

ක්‍රිස්තුන් වහන්සේ ද පෞද්ගලික ව යාච්ඤා කළා පමණක් නොව සාමූහික යාච්ඤාවට ද නො වරදවා ම ඉතා උනන්දුවෙන් සහභාගි වූ සේක.

> ඔවුන් වහන්සේ තමන් ඇති දැඩි වූ නාසරෙත් නුවරට පැමිණ සිරිත් පරිදි සබත් දවසේ දී ධර්ම ශාලාවට වැඩම කර කියවීම පිණිස නැගිට වදාළ සේක.
>
> (ලූක් 4:16)

සාමූහික යාච්ඤාවේ ඇති අවශ්‍යතාවය හා වැදගත්කම කිතු සමිඳාණන්ගේ ජීවිතාදර්ශයෙන් හොඳාකාරව ම පැහැදිලි වෙයි. එසේ ම සාමූහික යාච්ඤා වඩා බලවත් බව ක්‍රිස්තුස් වහන්සේ කළ පහත ප්‍රකාශයෙන් පැහැදිලි වෙයි.

> මන්ද, යම් තැනක දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් හෝ මාගේ නාමයෙන් රැස් වී සිටිත් ද එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි."
>
> (මතෙව් 18:20)

පුරාණ ගිවිසුමේ ජුදිත් පොතේ ජනතාව විසින් දෙවියන් වහන්සේට කරන ලද පොදු යැදුමට සාමූහික යාච්ඤා වඩා බලවත් බවට නිදසුනකි.

ඉශ්රායෙල්හි සියලු ජනයා බලවත් උනන්දුවෙන් දෙවියන් වහන්සේට හඬ නගා උන්වහන්සේ ඉදිරියෙහි යටහත් පහත් වූවෝ ය. ඔව්හූ ද ඔවුන්ගේ භාර්යාවෝ ද ඔවුන්ගේ දරුවෝ ද ඔවුන් සමග ජීවත් වූ විදේශීයයෝ ද කුලියට ගන්නා ලද කම්කරුවෝ සහ වහල්ලු ද ඉණ වටා ගෝනි රෙදි හැඳගත්හ. ස්ත්‍රීන් හා ළමයින් ඇතුළු ජෙරුසලමේ සියලු ඊශ්‍රායෙල්වරු ශුද්ධස්ථානය ඉදිරියෙහි මුණින් වැටී සෝ දුකින් තමන්ගේ හිස්වල අළු තවරා ගෙන, තමන්ගේ දෑත් ස්වාමින් වහන්සේ වෙත දිගු කළෝ ය.”

(ජුදිත් 4:911)

මෙම ක්‍රියාවෙන් ජනතාවගේ බලවත් උනන්දුව, යටහත් පහත් බව හා තම පාපවලට අවංකව පසුතැවිලි වීම ඉස්මතු වී පෙනේ. එහෙයින් මෙම යාච්ඤාව දෙවියන් වහන්සේට ප්‍රසන්න වූ බවත් ඔවුන්ට කරුණා කළ බවත් පහත පාඨයෙන් පැහැදිලි වෙයි.

සමිඳාණන් වහන්සේ ඔවුන්ගේ හඬට සවන් දී ඔවුන්ගේ සංවේගය ගැන කරුණාන්විත ව බැලූ සේක.

ජුදිත් 4:13)

ඉහත දැක්වෙන පාඨය අධ්‍යයනය කර සාමූහිකව යාච්ඤා කරන විට අප තුළ තිබිය යුතු ගුණාංග කීපයක් ලියන්න.

ක්‍රිස්තුන් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු ශ්‍රාවකයන් ද මරියතුමී ද වෙනත් ස්ත්‍රී හූ ද ජෙරුසලම් උඩුමහලේ මැදුරක සිට යාච්ඤාවේ නිරත වූ බව අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි සඳහන් වේ.

මේ සියලු දෙනා ස්ත්‍රීන් ද ජේසුස් වහන්සේගේ මෑණියන් වූ මරියතුමී ද උන්වහන්සේගේ සහෝදරයන් ද සමග එකතුව නොකඩ ව යාච්ඤාවේ නිරත වූහ.

(ක්‍රියා 1:14)

ප්‍රථම කිතුනු සංඝය යාච්ඤා කළ මේ අවස්ථාව සභා ආරම්භයේ වැදගත් තැනක් ගනී. මේ ශ්‍රාවක පිරිස ශුද්ධාත්ම බලය ලැබූ පසු නිර්භය ව සුභාරංචිය දේශනා කිරීමට පටන් ගත්හ. සමූහ යාච්ඤාවේ ඇති බලවත්කම ඉන් ඔබට වටහා ගත හැකිය යි සිතමි.

බර්ණබස් හා සාවුල් ධර්මදූත සේවයට යැවීමට පෙර අපෝස්තුලුවරුන් යාච්ඤා කළ බව ක්‍රියා පොතේ 13:3 හි සඳහන් වේ.

එවිට ඔවුහූ උපවාසයේ යෙදී යාච්ඤා කොට ඔවුන් පිට අත් තබා, ඔවුන් පිටත් කර යැවූහ.

(ක්‍රියා 13:3)

මෙසේ මුල් සභාව යාච්ඤාව තම සාංඝික ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් කරගත් බවත්, සෑම විශේෂ අවස්ථාවකදී ම සාමූහික වශයෙන් එක්රැස් වී දෙවියන් වහන්සේට යාච්ඤා කළ බවත් පෙනේ.

ශුද්ධාත්මයාණන්ගේ යාච්ඤාව, ජපමාලය, සම්ප්‍රදායික යාච්ඤා වුවත් පොදුවේ සංඝයක් ලෙස එක්රැස් වූ විට මෙවැනි යාච්ඤාවලට සියලු දෙනාට ම සහභාගි වීමට හැකි නිසා ඒවායේ විශේෂ අගයන් ඇත්තේ ය.

අවස්ථාවට උචිත පරිදි තමන්ගේ වදන්වලින් ම දෙවියන් වහන්සේට කන්නලව් කිරීම පෞද්ගලිකව හෝ සාමූහිත ව කළ හැකි ය. කණ්ඩායමක් වශයෙන් කරන්නේ නම් කණ්ඩායමේ සාමාජිකයන් අතර අදහස් බෙදා ගැනීමට අවස්ථාවක් උදා වේ. තමන්ගේ අත්දැකීම්, වේදනා ආදිය බෙදා ගැනීමෙන් එකිනෙකා අතර ගැඹුරු සමීපතාවක් ගොඩ නැඟේ. දෙවි පියාණන් වැඩ සිටීම ගැඹුරින් අත්දැකීමට මහගු අවස්ථාවක් වේ. පෞද්ගලිකව දෙවිඳුන්ට කන්නලව් කිරීමෙන් ද දෙවිඳුන් හා ගැඹුරු සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීමට ඔබට හැකි වේ.

**ඔබගේ දැනගැනීම සඳහා**

පෞද්ගලික හෝ පොදු හෝ සෑම යාච්ඤාවකින් ම නිසි ඵල ලබා ගැනීමට නම් මනසේ අවධානය හා හදවතේ භක්තිය ඇති ව යාච්ඤා කළ යුතු ය. ණය යුක්තියක් ඉටු කරන අදහසින් මුවින් පමණක් යැදීමෙන් ඵලක් වන්නේ නැත. තම හෘදයාංගම ආදර භක්තිය දෙවිඳුනට ප්‍රකාශ කරන අදහසින් එය කළ යුතු ය. අභ්‍යන්තරික ආශාව, ශ්‍රද්ධාව නැති ව පිටස්තරයෙන් කරන වත් පිළිවෙත් හෝ යාච්ඤා හෝ නිෂ්ඵල ය.